රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 27/96

මගේ අංකය :- IV/2/3/9(එච්)පොදු 51
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

1996 අගෝස්තු මස 30 වැනි දින

සියළුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**රාජ්‍ය නිලධාරීන්ගේ සේවය වයස**
**අවුරුදු 60 දක්වා දීර්ඝ කිරීම**

ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ 5:3 වගන්තිය අවසානයට මෙහි පහත දක්වා ඇති නව වගන්ති ඇතුලත් කරනු ලැබේ.

> " එතෙකුදු වුවත් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් යම් සේවා දීර්ඝ කිරීම් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරන්නේ නම් එම තීරණය ක්‍රියාත්මක කළ යුත්තේ අදාල අමාත්‍යවරයා විමසා ඒ ගැන එකඟතාවය ලබා ගැනීමෙන් පසුව පමණකි.
>
> රාජ්‍ය සේවකයින්ගේ සේවා දීර්ඝ කිරීම් ප්‍රතික්ෂේප කිරීමේදී එසේ කිරීම සඳහා සැකයකින් තොරව සනාථ කළ හැකි සෑහෙන හේතූන් තිබිය යුතුය. විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල විෂයය පථයට ගැනෙන සේවාවන්ට අයත් නිලධරයන් සම්බන්ධයෙන් වන විට ඔවුන්ගේ සේවා දීර්ඝය අදාල අමාත්‍යවරයා කුමන හේතුවක් මත වුවද ප්‍රතික්ෂේප කරන්නේ නම්, නිලධරියාගේ සේවා දීර්ඝය පිළිබඳව රාජ්‍ය පරිපාලන කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාට අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දිය යුතුය.''

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත
හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.